සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

52 S I

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019
First Term Test - Grade 13 - 2019

විභාග අංකය ............................ **නර්තනය (දේශීය) I** කාලය පැය දෙකයි

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 25 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහනෙහි යොදන්න.**
- **මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.**

01. ''තකුං ජිං ගත් තරිකිට කුංතක'' බෙර පදය අයත් වන්නම වනුයේ,
    1. සුරපති වන්නමට ය. 2. උදාර වන්නමට ය. 3. උකුසා වන්නමට ය.
    4. මයුරා වන්නමට ය. 5. මුසලඩි වන්නමට ය. (........)

02. තුනුරුවන් සහ දෙවියන් විෂයෙහි පූජා ද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා ඉදි කෙරෙන අත්‍යාවශ්‍ය සැරසිල්ලකි.
    1. මල් පැල 2. දරහැව 3. තොරණ 4. ගොප් ගෙඩිය 5. යහන (........)

03. තකරොංදං ගජිං ජිකුද ................ මෙය කුද කුජිගත වට්ටමේ,
    1. පළමු අඩව්වය 2. දෙවන අඩව්වය 3. තෙවන අඩව්වය
    4. සිව්වන අඩව්වය 5. වට්ටමට අදාල අඩව්වක් නොවේය. (........)

04. ගල්යුගයේ මානවයාගේ ශාරීරික පෙනුම වර්ධනය කර ගැනීමටත්, තම කණ්ඩායම පහසුවෙන් හඳුනා ගැනීමටත්, යොදාගත් වර්ණ සඳහා භාවිතා කළ ද්‍රව්‍යයන් වන්නේ,
    1. පහන්දැලි, ගස් පොතු, කොළ වර්ග, ක්‍රීම් වර්ග සහ ගුරු ගල්ය.
    2. සදුන්, කොකුම්, කස්තුරි, ගඩොල් කුඩු සහ සියඹලාය.
    3. කිරිමැටි, ගුරුගල්, බුලත්විට කොළ වර්ග සහ පහන්දැලිය.
    4. අල්ලියාදු කුඩු, ගඩොල් කුඩු, ලී කුඩු, ගස්පොතු සහ පහන්දැලිය.
    5. පොල් කටු අඟුරු, සදුන්, කොකුම්, පිණිදිය සහ කස්තුරිය. (........)

05. ''රන්විල රිද්දි විල කෙලිනා බිසවුන්ට ......'' මෙම කවි පාදයේ ලඝු, ගුරු හා සදැස්මත් ගණන වන්නේ,
    1. ගුරු 3 ලඝු 10 සදැස්මත් 13 2. ගුරු 4 ලඝු 8 සදැස්මත් 16
    3. ගුරු 4 ලඝු 10 සදැස්මත් 14 4. ගුරු 4 ලඝු 10 සදැස්මත් 18
    5. ගුරු 5 ලඝු 10 සදැස්මත් 20 (........)

06. ''නැරා තටු පතිනා .............. යන්නා පවන රූසා'' .............. මෙහි හිස්තැනට යෙදෙන පදය වන්නේ,

1. කලපත් දෙකඩත් කරසිත් තුටුවෙත්
2. ලෙලවත් සොලවත් පියඹත් නදදෙත්
3. අයිරත් පෙතියොත් තුඩගත් බුදසිත්
4. පවසත් මෙපවත් දැනසත් ලොවටත්
5. තානත් තනෙනත් තම්දන තානත් (........)

07. සිරිකත වන්නම සහ සමන් දෙව්රද යන වන්නම්වල නිර්මාණකරුවන් වන්නේ,

1. මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ මහතා සහ ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය ය.
2. මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතා සහ ජයසේන කෝට්ටගොඩ මහතා ය.
3. මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ මහතා සහ ආරියරත්න කළුආරච්චි මහතා ය.
4. මහාචාර්ය ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය සහ ආරියරත්න කළුආරච්චි මහතා ය.
5. මහාචාර්ය ආරියරත්න කළුආරච්චි මහතා සහ මුදියන්සේ දිසානායක මහතා ය. (........)

08. දළඳා මාලිගාවේ පෙරහැර හා සිව්මහා දේවාල පෙරහැර අතුරින් කාන්තා නියෝජනය විශේෂයෙන් දැකිය හැක්කේ,

1. කුඹල් පෙරහැරේදීය.
2. නාථ දේවාල පෙරහැරේදීය.
3. විෂ්ණු දේවාල පෙරහැරේදීය.
4. කතරගම පෙරහැරේදීය.
5. පත්තිනි දේවාල පෙරහැරේදීය. (........)

09. ඉතාලියේදී ආරම්භ වූ බටහිර බැලේ නාට්‍ය කලාවේ සීඝ්‍ර වර්ධනයක් සිදුවූයේ,

1. එංගලන්තයේ 8වන හෙන්රි රජ කාලයේය.
2. ඇමෙරිකාවේ ඒබ්‍රහම් ලින්කන් කාලයේය.
3. ජර්මනියේ මහා පෙඩ්රික් රජ කාලයේය.
4. ඉතාලියේ වික්ටර් එම්මානුවෙල් රජ කාලයේය.
5. 14වන ලුවී රජ කාලයේය. (........)

10. අයදතන යුගයේ රසිකයින් වෙනුවෙන් සම්ප්‍රදායික නර්තන ප්‍රතිනිර්මාණය කිරීමේදී පහත සඳහන් කරුණු ගැන අවධානය යොමු කළ යුතුය.

1. රංග වින්‍යාසය, රටා හා හැඩතල
2. තාක්ෂණ මෙවලම්, ශබ්ද වාහිනී යන්ත්‍ර හා පටිගත කිරීමේ යන්ත්‍ර
3. වේදිකාව, විදුලි ආලෝකය සහ පිටුපස තිරය.
4. රංග වින්‍යාසය, ඇඳුම් පැළඳුම් හා ගායනය.
5. වේදිකා ශිල්ප ක්‍රම, තාක්ෂණික මෙවලම් හා රංග වින්‍යාසය (........)

11. සන්නියකුම ශාන්තිකර්මයේ නර්තන ගායන වාදන අංග ලෙස දැක්වෙන්නේ,

1. පාලි නැටුම්, මෝල්ගස් කවි, අත්‍යාබෙර වාදනය
2. පාලි නැටුම්, සන්නි නැටුම්, පිං බෙර
3. සන්නි නැටුම්, කඩතුරා කවි, යක්කුන් පදය
4. සන්නි නැටුම්, යක්කම් නැටුනම්, මඟුල් බෙර
5. පාලි නැටුම්, කඩතුරා කවි, පිං බෙර වාදනය (........)

12. චලනයෙහි වෙනස්වීම් කෙරෙහි බලපාන සාධක වන්නේ,
   1. ශක්තිය, කාලය, වේගය හා දුර
   2. චලනය, ශක්තිය, කාලය හා වේගය
   3. අවකාශය, චලනය, කාලය හා වේගය
   4. සම්බන්ධතාව, ශක්තිය, කාලය හා වේගය
   5. පුද්ගල අවකාශය, කාලය, වේගය හා සම්බන්ධතාව (........)

13. භරත නාට්‍යයම් සම්ප්‍රදායේ එන රංග වස්ත්‍රාභරණවලට අයත් කොටස් කීපයකි.
   1. නේත්‍ර පට්ටම්, කාසිමාලෙයි, ක්‍රීටම්
   2. නේත්‍ර පට්ටම්, කාසිමාලෙයි, ජිමික්කි
   3. උච්ච පට්ටම්, චන්ද්‍ර පිරෙයි, කුමින්
   4. ජිමික්කි, කුණ්ඩලනී, චූරා
   5. ජිමික්කි, ධෝති, වලයන් (........)

14. තත්, ජිත්, තොං, නං යන සතර භීජාක්ෂර නියමිත ශබ්දය උපදින ආකාරයෙන් වාදනය කිරීම හඳුන්වනු ලබන්නේ,
   1. ලක බුරුල නමිනි.
   2. සුරල් නමිනි.
   3. දඹි දොඹිය නමිනි.
   4. වට්ටම් නමිනි.
   5. කස්තිරම නමිනි. (........)

15. අක්කා ඉතින් නාඩන්නේ ....... යන කවිපද කොටස ඇතුලත් වන්නේ,
   1. කොහොඹාහැල්ලේය.
   2. කුවේණි අස්නේය.
   3. මඩුපුරයේය.
   4. උෟරා යක්කමේය.
   5. දළුමුර පාලියේය. (........)

16. බ්‍රහ්ම විසින් නිර්මාණය කරන ලදුව ගණේෂ විසින් ප්‍රථමවරට වාදනය කළ බව පැවසෙන වාද්‍ය භාණ්ඩය වන්නේ,
   1. පක්වාජය
   2. තබ්ලාව
   3. මෘදංගය
   4. කෝල්බෙරය
   5. ඩෙන්ඩාව (........)

17. චෙයිකොව්ස්කිගේ සංගීතයෙන් නිර්මාණය වූ හංසවිල මුද්‍රා නාට්‍යය ප්‍රථමවරට වේදිකාගත කොට ඇත්තේ,
   1. වර්ෂ 1876 දීය.
   2. වර්ෂ 1877 දීය.
   3. වර්ෂ 1874 දීය.
   4. වර්ෂ 1875 දීය.
   5. වර්ෂ 1878 දීය. (........)

18. ශීර්ෂාභරණයක් ලෙස කාගුල් තොප්පිය පළඳිනු ලබන්නේ,
   1. දෙවොල් මඩුවේය.
   2. රටයකුමේදීය.
   3. සූනියම් ශාන්තිකර්මයේ දීය.
   4. දහ අට සන්නියේදීය.
   5. කිරි මඩුවේදීය. (........)

19. ශාන්තිකර්ම පරිසරයෙන් පරිභාහිරව කාන්තා රංග වස්ත්‍රාභරණ නිර්මාණ කලාවක් ගොඩනැගීම සඳහා පුරෝගාමීව කටයුතු කළේ,
   1. මහින්ද ඩයස් මහතා ය.
   2. රුක්මනී දේවි අරුන්ඩේල් මිය ය.
   3. චිත්‍රසේන ඩයස් මහතා ය.
   4. සෝමබන්දු විද්‍යාපති මහතා ය.
   5. වජිරා චිත්‍රසේන මහත්මිය ය. (........)

20. තාලය යන්න මෙසේ නිර්වචනය කළ හැකිය.
   1. ගණිතමය ආකෘතියක් මත ව්‍යුහගත කරන ලද රිද්මය.
   2. තිත් ක්‍රමය මත ව්‍යුහගත කරන රිද්මය.
   3. ආඝාත මත ව්‍යුහ ගත කරන රිද්මය.
   4. පංච තාලයට ව්‍යුහගත කරන රිද්මය.
   5. ත්‍රිවිධ ලය අනුව ව්‍යුහගත කරන රිද්මය. (........)


21. රංග වින්‍යාසය හා සබැඳි මූලික සංකල්ප වනුයේ,
   1. ශක්තිය, කාලය හා වේගය
   2. ශක්තිය, වේගය හා දුර
   3. අංග, ප්‍රත්‍යාංග හා උපාංග
   4. චලනය, අවකාශය හා සම්බන්ධතා
   5. ශක්තිය, කාලය හා දුර (........)

22. ජිංගත ගත කුද ගත ගත - කුද ගත කුකුදත් ජිං ජිං..... යන පද කොටස අයත් වන්නේ,
   1. කොතල පදයටය.
   2. මංගලම් නැටුමටය.
   3. අස්නේ නැටුමටය.
   4. කුද කුජිගත වට්ටමටය.
   5. බුලත් පදයටය. (........)

23. තරිකිට කුංදත් කුංදත් ජිං ජිං ගත්තත් ...... යනුවෙන් මඟුල් බෙරවලදී වාදනය කරනු ලබන්නේ,
   1. දේව පදයයි.
   2. ආශිර්වාද පදයයි.
   3. ගුරු පදයයි.
   4. වට්ටම් පිරීමේ පදයයි.
   5. පලමු වට්ටමයි. (........)

24. පොකුරු බෙරයේ මණ්ඩමත් හඩබෑයත් සම්බන්ධ කොට ඇති වරපටි ගෙතුම හඳුන්වනු ලබන්නේ,
   1. වෙනිවර ලෙසය.
   2. වලයම ලෙසය.
   3. කුන්දිරම් පල්ල ලෙසය.
   4. පුරප්පට්ටුව ලෙසය.
   5. කොට්ට බිස්ස ලෙසය. (........)

25. ශාන්තිකර්ම ශිල්පීන් උපත් කථාවන්ට අදාලව සැරසිලි නිර්මාණය කළ අතර ඉහතින් දැක්වෙනුයේ,



   1. සරසන ලද සන්නි පිදේනියයි.
   2. සරසන ලද තත්තිරික්කයයි.
   3. සරසන ලද රටයකුම් වීදියයි.
   4. සරසන ලද මහ සොහොන් වීදියයි.
   5. සැරසීමට ඇති සන්නිපිදේනි සැකිල්ලයි. (........)

- **අංක 26 සිට 35 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

26. සන්නියකුමේ එන සළුපාලිය නර්තන අංගය ................................................ මහතා විසින් නිර්මාණය කොට වේදිකාවට ගෙන එන ලදි.
27. ''ධීර ගුණති දීපංකර මුනි බුදු වෙමිනේ'' මෙය ................................................ කවියකි.
28. ඇඟිලි තුඩු නර්තන කලාවක් ලෙස ලොව ප්‍රකට බැලේ රංග කලාව සඳහා පළඳිනු ලබන සපත්තු විශේෂය ................................................ නමින් හඳුන්වයි.
29. ''ස්ටාල් බෙරම්'' නගරාධිපතිවරයාගේ චරිතය ඇතුළත් වන්නේ ................................................ බැලේ නාට්‍යයේය.
30. සංඛපාල හා දංඋදියාගේ කථා පුවත් පසුබිම කොටගෙන ................................................ ශාන්තිකර්මය ගොඩනැඟී ඇත.
31. වේදිකාවේ රංගනය රචනා කිරීම ................................................ නම් වේ.
32. භරත නාට්‍යයම් සංදර්ශනයක ඉතා දීර්ඝවූත් අසීරුවූත් නර්තන අංගය ................................................ නම් වේ.
33. බැලේ නර්තනයේ සම්මත ශිල්පීය ක්‍රමවේදයන් හඳුන්වාදෙන ලද්දේ ................................................ නම් ශිල්පියා විසිනි.

34. උඩරට හත්පදය නර්තනයේදී මුලින්ම නර්තනය කරනුයේ .................................................. පදයයි.

35. නර්තනයක ගායනය හා නාට්‍යයක දෙබස් අයත් වන්නේ .................................................. අභිනයටයි.

- **අංක 36 - 50 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර තිත් ඉරමත ලියන්න.**

36. දේශීය නර්තන සම්ප්‍රදායන් දෙකක් ඔස්සේ පස් තිත මුල් කොටගෙන නිර්මාණය වී ඇති නර්තන අංග දෙකකි.
    1. ..................................................................................................................................................
    2. ..................................................................................................................................................

37. ''ඇත එපිට දීපංකර මුණි විවරණ ගන්නේ'' මෙහි ඇතුලත් ලඝු හා ගුරු අක්ෂර ගණන වන්නේ,
    1. ලඝු ..................................................................................................................................
    2. ගුරු ..................................................................................................................................

38. 1892 දී රුසියාවේ ශාන්ත පීට(ර්)ස් බර්ග් නගරයේදී වේදිකා ගත වූ නට් ක්‍රැකර් .................................................. ගේ සංගීතයෙන් හා .................................................. ගේ රංග වින්‍යාසයෙන් පරිපූර්ණය.

39. දේශීය ශාන්තිකර්ම සැරසිලි ස්වාභාවික අමුද්‍රව්‍යය යොදා ගනිමින් කලාත්මකව හසුරුවා ඇත. ගොප් ගෙඩිය නිර්මාණය සඳහා යොදාගත් අමුද්‍රව්‍ය දෙකකි.
    1. ..................................................................................................................................................
    2. ..................................................................................................................................................

40. 14 වෙනි ලුවී රජුගේ නර්තන නිර්මාපකයන් ලෙස කටයුතු කොට ඇත්තේ,
    1. ..................................................................................................................................................
    2. ..................................................................................................................................................

41. අක්කා ඉතින් නාඩන්නේ - එක්ව ගොසින් අප එන්නේ මෙම ගායනය ඇතුළත්ත ශාන්තිකර්මය හා නර්තන අංගය නම් කරන්න.
    1. ශාන්ති කර්මය ........................................................................................................................
    2. නර්තන අංගය ........................................................................................................................

42. ලොව ප්‍රථම බැලේ පුහුණු පාසල හා එහි නිර්මාපකයා වන්නේ,
    1. ...................................................................... 2. ......................................................................

43. භරත නර්තන සම්ප්‍රදායෙහි සංගීත සම්ප්‍රදාය හා ප්‍රධාන වාද්‍ය භාණ්ඩය නම් කරන්න.
    1. ...................................................................... 2. ......................................................................

44. බෙර වාදයේදී ධ්වනි ගුණය පවත්වා ගැනීම සඳහා භාවිතා කරන වාදන විධි ක්‍රම දෙක නම් කරන්න.
    1. ...................................................................... 2. ......................................................................

45. රුක්මනී දේවී අරුන්ඩේල් විසින් භරත නාට්‍යයම් සඳහා ඉදිකරන ලද ආයතනය කුමක් ද ? එය පිහිටා ඇත්තේ කොහේ ද ?


1. ආයතනය - ..............................................................................................................................


2. ප්‍රදේශය - ..............................................................................................................................

46. නිල් + කොළ සහ රතු + නිල් යන වර්ග එකතුවීමෙන් සැදෙන ද්විතීයික වර්ණ දෙක සඳහන් කරන්න.

1. .................................................................. 2. ..................................................................

47.





ඉහත රූප සටහනෙහි දැක්වෙන භාරතීය නර්තන සම්ප්‍රදායට අයත් වාද්‍ය භාණ්ඩ දෙක පිළිවෙලින් නම් කරන්න.

1. .................................................................. 2. ..................................................................

48. බුලත් පදය හා කොතල පදය නර්තනය කරනු ලබන තාලරූපය නම් කරන්න.

1. බුලත් පදය - ..............................................................................................................................

2. කොතල පදය - ..............................................................................................................................

49. බැලේහි බැලරිකාවන් විසින් අඳිනු ලබන රැලි සහිත කොට ගවුම හා වළලුකර දක්වා වූ දිග ගවුම හඳුන්වන නම් සඳහන් කරන්න.

1. .................................................................. 2. ..................................................................

50. ''දෛනිකව දළදා මාළිගාවේ පූජාවට සහභාගිවන දයාසිරි මහතා එහි වත් පිළිවෙත් ඉටුකරමින් ලබන්නේ අපමණ මානසික සුවයකි.'' මෙයින් ප්‍රකට වන භාවය හා රසය නම් කරන්න.

1. භාවය - ..............................................................................................................................

2. රසය - ..............................................................................................................................

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

| 52 | S | II |
|---|---|---|

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

**First Term Test - Grade 13 - 2019**

විභාග අංකය .............................

නර්තනය (දේශීය) II

කාලය පැය තුනයි

- **පළමුවන කොටසේ ප්‍රශ්න අංක 01 හා 02 අනිවාර්ය වේ.**
- **II හා III යන කොටස් වලින් එක් ප්‍රශ්නය බැගින් ඇතුලත් වන සේ තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **සෑම ප්‍රශ්නයකම (i) කොටසට ලකුණු 06 ක් ද (ii) කොටසට ලකුණු 06 ක් ද (iii) කොටසට ලකුණු 08 ක් ද වශයෙන් මුළු ලකුණු 20 ක් බැගින් හිමිවේ.**

## I කොටස

01. i. පහත සඳහන් කවි පද සුළු මහ දෙතිතට ප්‍රස්ථාර කරන්න.
"ඉනේ හවඩි රන් කෙඳිවන් - පයේ ගිගිරි වළලු ලවන්"
ii. මංගලම් නර්තනයට අයත් අලංකාර බෙර පදයක් අදාල තිතට ප්‍රස්ථාර කරන්න.
iii. කුද කුජිගත වට්ටමේ දෙවෙනි අඩව්ව මාත්‍රා තුනේ තාලයට ප්‍රස්ථාර කරන්න.

02. දේශීය නර්තනය විකාශනයේදී භාරතීය ආභාසය ලැබී ඇති බව ඓතිහාසික තොරතුරු මඟින් හෙළිදරව් වේ.
i. විජයාවතරණයට පෙර මෙරට දියුණු සංස්කෘතියක් පැවැති බවට නර්තන කලාව ඇසුරින් සාධක දක්වා පැහැදිලි කරන්න.
ii. දඹදෙණි හා කුරුණෑගල යුගවල පැවති වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු සාහිත්‍ය මූලාශ්‍ර දෙකක් ඇසුරින් දක්වන්න.
iii. දේශීය නර්තන කලාව විකාශනයේදී භාරතීය ආභාසය ලැබී ඇති බවට අනුරාධපුර හා පොළොන්නරු යුගවලින් සාධක දෙක බැගින් ගෙන විමසන්න.

## II කොටස

03. සන්නියකුම් යාගය තුළ සමාජ විවරණයන් මෙන්ම සමාජයීය පැවතුම් පිළිබඳ උපදේශනයන් ද අන්තර්ගතය.
i. සන්නියකුම් යාගය පැවැත්වීමේ අරමුණු විස්තර කරන්න.
ii. සන්නියකුමෙහි උපත් කථා ඇසුරින් ඉහත කියමන පැහැදිලි කරන්න.
iii. කාන්තාවකගේ කුල ගෞරවය පිළිබඳ දෙනු ලබන සමාජමය පණිවිඩය සූනියම් යක්ෂණියගේ අවස්ථා තුන උදාහරණයට ගනිමින් විමසුමක් කරන්න.

04. පහතරට ශාන්තිකර්ම අතර සන්නියකුම සුවිශේෂී ස්ථානයක් ගනු ලබයි.

i. සන්නියකුමට අදාල සුවිශේෂී සැරසිලි නම්කොට ඒවා රංග කාර්ය හා සම්බන්ධවන ආකාරය විස්තර කරන්න.

ii. සන්නියකුමෙහි එන චරිත නිරූපණයන්හිදී ගායන, වාදන යොදාගෙන ඇති අයුරු පැහැදිලි කරන්න.

iii. දේශීය ආයුර්වේද වෛද්‍ය ක්‍රමය හා සම්බන්ධ මනෝ චිකිත්සක ක්‍රමයක් ලෙස සන්නියකුමෙහි අන්තර්ගත ගුණාංග පිළිබඳ විමසුමක් කරන්න.

05. ශාස්ත්‍රීය නර්තන මෙන්ම ගැමි නැටුම් මගින් ද ශ්‍රී ලාංකීය අනන්‍යතාවන් මනාව පිළිඹිබු වේ.

i. උඩරට හා පහතරට නර්තනයන්හී දක්නට ලැබෙන පැනීම් හා කැරකීම් දෙක බැගින් විස්තර කරන්න.

ii. ''තක්කාලීන ගැමි සමාජය තුළ යහපත් සහජීවනයක් පැවති බව'' ජන ගායනා හා නැටුම් උදාහරණයට ගනිමින් පැහැදිලි කරන්න.

iii. දේශීය සැරසිලි කලාව හා සම්බන්ධ ''ගොප් ගෙඩිය'' සකස් කරගන්නා ආකාරය විස්තර කර එහි රූප සටහනක් ඇඳ දක්වන්න.

## III කොටස

06. පහත සඳහන් වගුවෙහි (අ), (ආ), (ඉ) යන කොටස්වලට අදාලව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| (අ) | (ආ) | (ඉ) |
|---|---|---|
| ශබ්දම්/ වර්ණම් | අට්ටියල් / සලංගෙයි | නල දමයන්ති / කරදිය |
| පරන් / තරානා | ලෙහෙගා/ රෙස්වාජ් | කල්පනා / ජීවනයේ රිද්මය |
| ශබ්දම් /ථුම්රි | ගෝදාරි/ කළුකාරම් | බැරිසිල්/ පටාචාරා |
| වර්ණම්/ පරන් | ක්ලැසික් ටුටු/ ස්කල්පෙ | නිදි කුමරිය/ නට් ක්‍රැකර් |

i. (අ) කොටසින් භරත නාට්‍ය සම්ප්‍රදායට අයත් නර්තන අංග දෙකක් නම් කර ඒවා පිළිබඳ විස්තර කරන්න.

ii. (ආ) කොටසින් කථක් නර්තනයට අයත් රංගාවස්ත්‍රාභරණ දෙකක් නම් කොට කථක් වස්ත්‍රාභරණ මුස්ලිම් ආභාසය මත විකාශනය වූ ආකාරය පැහැදිලි කරන්න.

iii. (ඉ) කොටසේ ඇති බැලේ නාට්‍ය දෙකක් නම් කර බැලේ නාට්‍යයන්හි සංචලන හා සංගීතය යොදා ගන්නා අයුරු එක් නාට්‍යයක් ඇසුරින් විමසන්න.

07. නර්තන නිර්මාණයන්හි ප්‍රාසංගික බව තීව්‍ර කිරීමෙහි ලා අංග රචනය හා රංග වස්ත්‍රාභරණ වැදගත් සාධකයක් වේ.

i. නර්තනය අංග රචනයේදී සැලකිය යුතු වැදගත් කරුණු මොනවාදැයි පැහැදිලි කරන්න.

ii. නර්තනය හා සබැදි අතීත හා වර්තමාන අංග රචනා ක්‍රම පිළිබඳ සංසන්දනාත්මකව කරුණු දක්වන්න.

iii. නූතන වේදිකාවේ රංග වස්ත්‍රාභරණවල විචිත්‍රත්වය වර්ධනයෙහිලා වේදිකා ආලෝකයේදී යොදාගන්නා තාක්ෂණික විධික්‍රම පිළිබඳ විමසුමක් කරන්න.

08. වෙනත් සංස්කෘතීන්ගේ ආභාසය නූතන වේදිකාවේ නර්තන අංග කෙරෙහි විවිධාකාරයෙන් බලපා ඇත. පහත මාතෘකා ඔස්සේ ඒ පිළිබඳ සාකච්ඡා කරන්න.

i. රංග වින්‍යාසය ii. රංග වස්ත්‍රාභරණ iii. සංචලන සහ සංගීතය

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**පළමු වාර පරීක්ෂණය - 2019**

| 13 ශ්‍රේණිය | නර්තනය I | පිළිතුරු පත්‍රය |
|---|---|---|


**I කොටස**

| | | | | |
|---|---|---|---|---|
| 1. 3 | 6. 2 | 11. 5 | 16. 3 | 21. 4 |
| 2. 5 | 7. 1 | 12. 1 | 17. 2 | 22. 5 |
| 3. 4 | 8. 5 | 13. 2 | 18. 1 | 23. 2 |
| 4. 3 | 9. 2 | 14. 3 | 19. 4 | 24. 3 |
| 5. 4 | 10. 5 | 15. 1 | 20. 1 | 25. 1 |

| | | | |
|---|---|---|---|
| 26. කේ. ඇස් ප්‍රනාන්දු | 27. සූවිසි විවරණ | 28. ස්කල්ෆෝ | 29. ද නට් ක්‍රැකර් |
| 30. සන්නියකුම / දහ අට සන්නිය | 31. රංග වින්‍යාසය | 32. වර්ණම් | 33. කාලෝ බ්ලැසීස් |
| 34. බුලත් පදය | 35. වාචික | 36. 1. මංගලම් | 2. මුල් මාත්‍රය |
| 37. 1. ලඝු 12 | 2. ගුරු 5 | 38. 1. චෙකොස්කි | 2. මාරියස් පෙටිපා |
| 39. 1. කෙසෙල් බඩ | 2. ගොප්කොළ | 40. 1. ජීන් බැස්ටිස්ලලී | 2. පියාරේ බියුචැම්ස් |
| 41. 1. කොහොඹා කංකාරිය | 2. කොහොඹා හැල්ල | 42. 1. 14 වෙනි ලුවී රජු | 2. ඇකඩමි රෝයල් ඩාන්ස් |
| 43. 1. කර්ණාටක සංගීතය | 2. මෘදංගය | 44. 1. ලක බුරුල | 2. දඹි දොඹිය |
| 45. 1. කලා ක්ෂේත්‍රම් | 2. ආඩියාර් / මදුරාසිය | 46. 1. මොනර නිල | 2. රතුවන් දම් / මැජන්ටා |
| 47. 1. මෘදංගය | 2. වීනාව | | |
| 48. 1. 12 + 1 2 3 4 දෙතිත | 2. 1 2 3 + 1 2 3 තනිතිත | 49. 1. ක්ලැසික් ටුටු | 2. රොමැන්ටික් ටුටු |
| 50. 1. භක්ති/ශාන්ත/ශම | 2. ශාන්ත | | |


**II පත්‍රය - I කොටස**

01. i.



| | | |
|---|---|---|
| නිවැරදි සංකේත භාවිතයට ලකුණු | - | 02 |
| පද දෙක නිවැරදිව ප්‍රස්ථාරකරණය | - | 04 |
| ලකුණු | - | 06 |


ii.



හෝ තිතට අදාලව අලංකාර බෙර පදයක් ප්‍රස්ථාර කර තිබීම.

| | | |
|---|---|---|
| නිවැරදි සංකේත භාවිතය | - | 02 |
| නිවැරදි පද ප්‍රස්ථාරයට | - | 04 |
| ලකුණු | - | 06 |

iii.



නිවැරදි සංකේත භාවිතයට ලකුණු - 02
අඩවිව සම්පූර්ණයෙන් නිවැරදිව ප්‍රස්තාර - 06
ලකුණු - 08
මුළු ලකුණු - 20

02. i. විජයාවතරණයට පෙර මෙරට යක්ෂ, නාග, දේව වශයෙන් ජන කොට්ඨාසයන් විසූ බවත් එකල පැවති උත්සවවල නෘත්‍ය, ගී වාද්‍ය පවත්වා ඇති බවත් මහා වංශය ඇසුරින් සාධක දක්වා එකී ලක්ෂණ දියුණු සංස්කෘතියක ලක්ෂණ බව පැහැදිලි කර තිබීම. (ල. 06)

ii. කුරුණෑගලල යුගයට අයත් සිංහල ථූප වංශය සහ දළඳා සිරිත ඇසුරින් සාධක දක්වා තිබීම. විශාල ප්‍රමාණයක් වාද්‍ය භාණ්ඩ පැවැති බව, පංචතූර්‍ය භාණ්ඩ පැවති බව හා රාජ්‍ය අනුග්‍රහයෙන් විවිධ අවස්ථාවන්හිදී ඒවා යොදාගෙන ඇති බව. (ල. 06)

iii. * විවිධ රාජ්‍ය හා ආගමික උත්සවයන්හිදී කාන්තා නර්තන ප්‍රමුඛ ස්ථානයක් ගෙන ඇති බවටත්, කුට්ටම් පොකුණෙන් සොයා ගන්නා ලද නිළි රූපයෙහි හස්ත මුද්‍රා භාරතීය ලක්ෂණ පෙන්වන බවටත් අනුරාධපුර යුගයෙන් සාධක හමුවේ. ලෝවාමහාපායේ කණු හිස්වල වීණා වාදකයින් දක්නට ලැබෙන බව.
* පොළොන්නරු යුගයට අයත් පාලමොට්ටායි ශිලා ලිපියේ දේවදාසීන් පිළිබඳ විස්තර කර ඇති බව.
* අංක 2 ශිව දේවාලයෙහි ඇති කැටයම් ආදියෙන් විස්තර කර තිබීම. (ල. 08)

## II කොටස

03. i. සන්නියකුම පැවැත්වීමේ අරමුණු අතීත හා වර්තමාන ලෙස අදාලව කරුණු ලියා ඇත්නම්. (ල. 06)

ii. සන්නියකුමේ උපත්කථා වන සංඛපාල රජු පිළිබඳ කථාව සහ දංඋදියාගේ කථා ඇසුරින් සමාජ විවරණය සහ සමාජ පැවතුම් පිළිබඳ විස්තර කර ඇත්නම්.
උදා :- වෛරය, ක්‍රෝධය, බොරු කීම, කේළාම් කීම වැනි අයහපත් ක්‍රියාවල ප්‍රතිඵලය විනාශය බව.
පලිගැනීමේ චේතනාව නොවිමසා කටයුතු කිරීම නුසුදුසු බවත් එම නිසා පවුල් සංස්ථා බිඳ වැටීම්, මාපිය සෙනෙහස අහිමිවීම්, මානසික අසහනය ඇතිවන බව ආදී ලෙස විස්තර කර ඇත්නම්. (ල. 06)

iii. * සූනියම් යක්ෂණියගේ අවතාර 3 ලෙස තරුණ කාන්තාව, බඩදරු කාන්තා, දරුවකු අතැති බව ලෙස දක්වන බව.
* මෙය නාට්‍යමය අවස්ථාවක් බව.
* ගායනා හා සංවාද මඟින් ගැහැණියක් අසම්මත ක්‍රියාවන්ට යොමුවීමෙන් සමාජ අපහාසයට හා උපහාසයට ලක්වන බව.
* කාන්තාවක් විවිධ අවස්ථාවන්හිදී හැසිරෙන ආකාරය නර්තන හා ගායනා මඟින් ඉදිරිපත් කරන බව.
* ඒ ඒ අවස්ථා වෙස්මුහුණු භාවිතයෙන් ඉතා සාර්ථකව ඉදිරිපත් කරන බව.
* කාන්තාවකගේ යහපත් චර්යාවන් සමාජය අපේක්ෂා කරන බව. (ල. 08)

04. i. * සන්නියකුමේ එන සුවිශේෂී සැරසිලි ලෙස සන්නියකුම් වීදිය, කපාල වීදිය, මල්යහන, ඊගහ, වීදුරුකඩුව, යම මුගුර, තුවක්කුව, දුනු පන්දම, දෙකොන විලක්කු ආදිය යොදා ගන්නා ආකාරය විස්තර කිරීම.
උදා :- සන්නියකුම්වීදිය ප්‍රජාසනයක් මෙන්ම යකුන්ට ප්‍රවේශ මාර්ගයක් ලෙස යොදා ගන්නා බව.
ඇතැම් යකුන් වීදිය කෙලවරින්ද ඇතැම් යකුන් වීදිය මතට නැගගෙනද රඟමඩලට පිවිසීම සිදුකරන බව.
* සන්නි කුඩුව සහ පිදේනි තට යකුන්ට දොල පිදේනි පිදීමට යොදාගන්නා බව.
* අභිමාන යකා තුන්මුලු පිදේනිය රැගෙන පිටවන බවත් කෝලසන්නිය ඉනේ, ඉහේ, අතේ පිදේනි තටු බැඳගෙන රංග කාර්යයේ යෙදෙන බව. (ල. 06)

ii. * සන්නියකුමේ සමයම්පද නැටීමේදී හා යක්ෂ චරිත සහාගත කිරීමේදී භයානක රසය ජනිතවන ආකාරයට චරිත ගෙනහැර දැක්වීමට බෙර වාදනය මනා පසුබිමක් සපයන බව.
* එක් එක් යක්ෂයා සහාගතවීමට පෙර ගයනු ලබන කෙටි කවි අවසානයේ කෙරෙන ආරම්භක පදය ''දැනිං දොං දොංදොං....'' මීට කදිම නිදසුනක් බව.
* තුන්යාමයේ බෙර පද වාදනයේදී ගායනය පාදක කරගත් වාදනය නර්තනය පාදක කරගත් වාදනය ආදී ලෙස විවිධ අවස්ථාවලදී ගායන වාදන ඉදිරිපත් කරන බව.
* යක්, සන්නි හා පාලි වැනි ගැටුම් සහාගත කිරීමේදී ඒ ඒ චරිතවල ලක්ෂණ ඉස්මතුවන ලෙස වාදනය කරන බව.
ආදී ලෙස විස්තර කර ඇත්නම් (ල. 06)

iii. * සන්නියකුමේ උපත්කථාව හා සම්බන්ධ මහා කෝල සන්නි යකා සභාවට පැමිණ ලෙඩ රෝග පිළිබඳ ඉදිරිපත්කරන කවි ගායනා, සංවාද හා නර්තන මගින් ආතුරයාගේ මානසික සුවය ඇතිවන බව.
* සන්නි සහ පාලි මඟින් මිනිසාට ඇතිවන ලෙඩ රෝග සහ පිදවිලි ගැන කියවෙන අතර මිනිසුන්ට ඇතිවන ලෙඩරෝග සුවවන බවට විශ්වාසය ඇතිවන බව.
* තොලබෝ, හීරැස්ස, දිවිකදුරු වැනි ද්‍රව්‍ය මෙහිදී භාවිතයට ගන්නා අතර ආයුර්වේද භූතකර්ම විද්‍යාව සඳහාද ප්‍රතිකාර ක්‍රම ලෙස යොදාගන්නා බව. ආදී ලෙස විස්තර කර ඇත්නම් (ල. 08)

05. i. උඩරට
* නමස්කාර ඉරියව්ව ඉහළ ආකාශයට ගොස් එම ඉරියව්වෙන් පතිතවීම සිදුවන බව.
* නමස්කාර ඉරියව්වෙන් ඉහළ අවකාශයේ කැරකෙන බව.
* නමස්කාර ඉරියව්වෙන් ඉදිරියට පතිත බව.
* ඉදිරියෙන් කැරකීම හා පිටුපසින් කැරකීම සිදුවන බව.
* මංඩියේ සිට පාදයක් ඔසවා දකුණට හෝ වමට කැරකෙන බව.
* මංඩියේ සිට පාදය ඉදිරියෙන් තබා කැරකෙන බව.

පහතරට
* දොං - පිටුපසට පැනීම.
* දැනිං - මංඩියට පැනීම.
* බඹර වළල්ල - දෙආකාරයකට සිදුකරන බව.
* මාලක්කම - වෘත්තාකාරව පැනීම.
* ආසුව - සරල පිනුම් විශේෂයක්
* පතහ විස්ස - පිනුම් ක්‍රමයක් බව ආදී ලෙස විස්තර කර ඇත්නම් (ල. 06)

ii. * පන් නෙලීම. * ගොයම් කැපීම. * ගොයම් නෙලීම. * කුළු නැටුම.

උදා :- * ''අක්කණ්ඩියේ යමු අපි පන් නෙලන්නට'' * ''හිසට පියුම්ලා පැදුරක් වියන්ඥා''
* ''නැන්දට බලන්නට පැදුරක් වියන්නඥා'' * ''වරම් වරම් ඉර සඳ දෙවි අතින් වරම්''
* ''උදේ සිටන් වකුටු කොන්ද දිග හැරපල්ලා'' ආදී ලෙස ගැමි නැටුම්වල එන ගායනා උදාහරණ දෙමින් විස්තර කර ඇත්නම්. (ල. 06)

iii. ගොජ්ගෙඩිය සකස්කරන ආකාරය විස්තර කර රූප සටහනක් ඇඳ දක්වා ඇත්නම් (ල. 08)

## III කොටස

06. i. ශබ්දම්, වර්ණම්

ශබ්දම්
* භරත නාට්‍යම් හි එන අරංගේත්‍රම් උළෙලකදී ඉදිරිපත් කරනු ලබන තෙවන නර්තන අංගය බව.
* භාව ප්‍රකාශනයට ප්‍රධාන තැනක් හිමිවන බව.
* ශබ්දම් ආරම්භ වන්නේ අක්ෂි සහ ගෙලෙහි චලන සිදුකර කෙටි ජති කොටසක් නටමින් ආරම්භවන බව.
* ඉන්පසු භාව ප්‍රකාශන ඉදිරිපත් කරන බව.
* දෙවියන්ගේ ගුණ වර්ණනා කිරීම බොහෝවිට දක්නට ලැබෙන බව.
* ක්‍රිෂ්ණ දෙවියන්ගේ විවිධ අවස්ථා භාව මඟින් ප්‍රකාශ කරන ලද බව.
* භක්තිය දනවන ගීත රාගවලට අනුව ගයන බව. ආදී ලෙස කරුණු දක්වා ඇත්නම්.

වර්ණම්
* භරත නාට්‍ය සංදර්ශනයක දක්නට ලැබෙන ඉතාම දීර්ඝතම වූ අසීරු නර්තන අංගයක් බව.
* නෘත්ත, නෘත්‍ය, නාට්‍ය යන ලක්ෂණ වලින් යුක්ත බව.
* ශිල්පීය දක්ෂතාවය මැන බැලෙන අංගයක් බව.
* සංකීර්ණ තාල හා ලය මත පිහිටා තැබීමේ හැකියාව දැක්වෙන අවස්ථාවක් බව.
* දරා ගැනීම, ශ්‍රම ශක්තිය, නර්තනය පිළිබඳ ගැඹුරු අවබෝධයක් මෙයින් ඇතිවන බව.

ii. ලෙහෙඟා, රෙස්වාජ්
* කථක් නර්තන ශිල්පීහු දේව මූර්තිවල සහ චිත්‍රවල ඇතුලත් ඇඳුම් පැළඳුම් ඇසුරෙන් තම රංග වස්ත්‍රාභරණ සකසා ගත් බව.
* උත්තර භාරතයේ බොහෝ ජනයා වෛෂ්ණව භක්තිකයන් වූ බැවින් ක්‍රිෂ්ණා හා රාධාගේ ස්වරූපයෙන් සැරසීමටත් යොමුවී ඇති බව.
* අක්බාර් රජුගේ අවධියවන විට මුස්ලිම් ආභාෂය කථක් නර්තනයට මෙන්ම ඇඳුම් පැළඳුම්වලටද බලපෑ බව.
* කෝවිල්වල පැවති ආගමික ස්වරූපය වෙනස්වී රාජ සභා නර්තනයක් ලෙස සකස්වීමෙන් ඇඳුම් පැළඳුම්වලට ද එම බලපෑම ලැබුණු බව. ආදී ලෙස කරුණු දක්වා ඇත්නම්. (ල. 06)

iii. ආ කොටසේ ඇති බැලේ නාට්‍ය 2 - 1. නිදි කුමරිය 2. නට් ක්‍රැකර්

නට් ක්‍රැකර්
* රුසියාවේ පීටර්ස්බර්ග් නගරයේදී වේදිකා ගතවූ බව.
* චෙයිකොව්ස්කිගේ සංගීතයෙන් හා මාරියස් පෙටිපාගේ රංග වින්‍යාසයෙන් යුක්ත බව.
* ලෝක ප්‍රකට වූ නාට්‍යයක් බව.
* අරාබි කෝපි නැටුම, චීන තේ නැටුම ආදිය විශේෂාංගයක් ලොව ඉදිරිපත්වන බව.
* ඉතා උචිත ලෙස සංගීතයෙන් අවස්ථා නිරූපණය කෙරෙන බව.

**නිදි කුමරිය**

* මෙම නාට්‍ය රුසියාවෙන් ලොවට දායාද කළ නර්තනාංගයක් බව.
* සංගීත නිර්මාණය චෙයිකොව්ස්කි විසින් සිදුකල බව.
* රංග වින්‍යාසය මාරියස් පෙට්පා විසින් සිදුකර ඇති බව.
* රොමැන්ටික් බැලේ ආකෘතියෙන් නිර්මාණය වුවක් බව.
* උත්සවය අවස්ථාවේ Pas de dent යන අසීරු නර්තනයක යෙදෙන බවද සෙසු පිරිස MAZURK වැනි නැටුම් නටන බව. මින් එක් නාට්‍යයක් පිළිබඳ ලියා ඇත්නම් (ල. 08)

07. i.

| අතීත | නූතන |
|---|---|
| * අමනුෂ්‍ය මුහුණු නිර්මාණය කර තිබීම සුවිශේෂත්වයක් බව. | * අද්‍යතනයේ අංගරචනය තාක්ෂණික අතින් උසස් මට්ටමක පවතින බව. |
| * යක්ෂ චරිත සඳහා මුහුණේ කළු ආලේප කිරීම සඳහා පහන්දැලි, අඟුරු, පොල්තෙල් මිශ්‍රකොට සාදාගත් බව. | * විවිධ අංග රචනා ක්‍රම භාවිතා කරන බව. උදා :- චරිතාංග අංග රචනය, සාමාන්‍ය අංග රචනය. |
| * අඳුන් ගෑම පහතරට සම්ප්‍රදායේ සුවිශේෂී අංග රචනා ලක්ෂණයක් බව. | * විවිධ අංග රචනා ද්‍රව්‍ය භාවිතා කරන බව. උදා : Pane Cake, Greass Paint, eye liner, lipstick |
| * චරිතය මනාව ඉස්මතුවීමට බාධාවක් වූ බව. | * ඉතා හොඳින් චරිතය අවබෝධවන බව. |

ආදී ලෙස කරුණු දක්වා ඇත්නම් (ල. 06)

ii. * නර්තනයේ ස්වභාවය
* වේදිකාවේ ස්වභාවය සහ අවකාශය
* රංග වස්ත්‍රාභරණ
* නර්තන ශිල්පියාගේ මුහුණේ හැඩය හා වර්ණය (මාංශපේශී සැකැස්ම)
* ආලෝකකරණය
* ප්‍රේක්ෂකාගාරයට පෙනෙන ආකාරය ආදී ලෙස කරුණු දක්වා ඇත්නම් (ල. 06)

iii. * රංග වස්ත්‍රාභරණ නිර්මාණයේදී ද්‍රව්‍ය හා ආලෝක වර්ණ ද්විත්වය අතර ගැලපීම ඉතාම අවශ්‍ය බව.
* ස්වාභාවික වර්ණ හා ආලෝක වර්ණවල විවිධතා හඳුනාගත යුතු බව.
* ද්‍රව්‍යයන් මත අලෝක වර්ණ පතිතවීමෙන් සෑදෙන වර්ණ සංයෝජනය පිළිබඳ අවබෝධය තිබිය යුතු බව. ආදී ලෙස අදාල කරුණු දක්වා ඇත්නම්. (ල. 08)

08. i. * කිසියම් නර්තන අංගයක ආරම්භයේ සිට අවසානය දක්වා ප්‍රායෝගික කොටස් සැලසුම් සහගත ලෙස රංගභූමිය මත හැසිරවීම රංග වින්‍යාසය යනුවෙන් හැඳින්වේ. (කිසියම් රංගනයක් රචනා කිරීම)
* බටහිර බැලේවල එන පැනීම් කැරකීම්වල ආභාෂය දේශීය නර්තන සඳහා යොදා ඇති බව.
* විවිධ රටා අනුව නර්තනය හැසිරවීම. අවකාශ භාවිතය, තාල භාවිතය ආදී ලෙස රංග රචනය කිරීමට යොමුවීම සඳහා ආභාෂය බැලේ හා ඔපෙරාවල ආභාෂය ලබා ඇති බව. ආදී ලෙස දක්වා ඇත්නම් (ල. 06)

ii. රංග වස්ත්‍රාභරණ
* අතීතයේ දේශීය නර්තන කලාවන්ට ආවේණික හා සාම්ප්‍රදායික ඇඳුම් පැළඳුම් පැවති බව.
* ගෝලීයකරණය සමග විවිධ රටවල ඇඳුම් පැළඳුම් හා විලාසිතා දේශීය නර්තනයට එකතුවී ඇති බව. උදා :- වීදුරු කැබලි, රේන්ද පටි, දිලිසෙන වර්ණ භාවිතයට හුරු වී ඇති බව.
* විවිධ වර්ණ භාවිතය වෙන්ව ඇඳීමට පහසු ලෙස සැකසූ ඇඳුම් භාවිතාවන බව.
* බටහිර ආභාෂය මත කෙටි ඇඳුම් සහ ඇඟට ඇලෙන සේ සකසාගත් ඇඳුම් භාවිතාවන බව.

ආදී ලෙස කරුණු දක්වා ඇත්නම් (ල. 06)

iii. සංචලන හා සංගීතය
* අතීතයේ මෙරට පැවති සාම්ප්‍රදායික නර්තනවලදී කවි ගායනා බෙර පද තාලයට කළ නමුත් නූතනය වනවිට සංගීතයට අනුව සැකසී ඇති බව.
* බටහිර සංගීතය මෙරට නර්තනාංගවලට ආභාෂය ලබා ඇතිබව.
* දේශීය මුද්‍රා නාට්‍ය බිහිවීම නිසා දේශීය නර්තන කලාවද නව මුහුණුවරක් ගත් බව.
* බටහිර නර්තනවල පැනීම්, කැරකීම් දේශීය නර්තන හා මුසුකොට ගෙන ඇති බව.
* චිත්‍රසේන වජිරා යුවල විසින් නිර්මාණය කරන ලද මුද්‍රා නාට්‍යවල මෙන්ම නෘතාංජලී, නවාංජලී වැනි නාත්‍ය ප්‍රසංගවලදී දෙස් විදෙස් සංගීත ශෛලීන් ඇසුරෙන් නර්තන නිර්මාණ කර ඇති බව.
* නවීන තාක්ෂණික මෙවලම් භාවිතය නර්තන නිර්මාණකරණයට මහඟු සේවයක් සපයන බව.

ආදී ලෙස කරුණු දක්වා ඇත්නම් (ල. 08)